සත්කාරය

දිව්‍යමය රසඟුලාවක්
ධනය උපයන කලාවක්

කොකෝවා

DEPARTMENT OF EXPORT AGRICULTURE
DEA

- වගා කිරීම
- වගා නඩත්තුව
- අස්වනු සැකසීම

- වගාවට පෙර ගල් වැටි, කාණු හා පීවි වැටි යන පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යොදා ඔබේ ඉඩම සංවර්ධනය කරන්න.
- වැඩි ආදායමක් සඳහා යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් යොදා පරිසර හිතකාමීව වගාව මනාව නඩත්තු කරන්න.

COCOA

Theobroma cacao

වැඩි විස්තර දැනගන්න විමසන්න

අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරි
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

සහකාර අධ්‍යක්ෂ
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී

අපනයන කෘෂිකර්ම තොරතුරු කේන්ද්‍රය-ගැටඹේ
දුරකතන අංක 0812-388651

dea.information2017@gmail.com

www.exagri.info

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651

සැකසුම : මාධ්‍ය හා සන්නිවේදන අංශය

හැඳින්වීම

සෙවන ප්‍රිය ප්‍රණීත පානීය බෝගයක් වන කොකෝවා ශාකයේ නිජ බිම දකුණු ඇමරිකාවයි. ශ්‍රී ලංකාව තුළ මුලින්ම කොකෝ වගාවක් ඇරඹෙන්නේ වසර 1819 දී මාතලේ නාලන්ද ප්‍රදේශයේය. වසර 1960 වන විට දේශීය කොකෝවා වගා බිම් ප්‍රමාණය අක්කර 30,000කි. නමුත් වර්තමානයේ එය අක්කර 5,000ක් දක්වා අඩුවී ඇත. අන්තර් ජාතික කොකෝවා සංවිධානයට අනුව ශ්‍රී ලංකාව රසයෙන් අනූන කොකෝවා නිපදවන රටක් වේ. 2017 වසරේ කොකෝ නිෂ්පාදන මෙ.ටොන්. 2500ක් අපනයනය කර රු.මි. 2350ක් උපයා ඇත. එමෙන්ම වාර්ෂිකව කොකෝ නිෂ්පාදන මෙ.ටො. 5,000ක් පමණ ප්‍රමාණයක් ආනයනය කිරීමට රු.මි. 3,500ක් පමණ ද වැයවේ. පොල් හා රබර් වගාවන්ගේ අතුරු බෝග ලෙස ද ගෙවතු ආශ්‍රිතව හෝ තනි වගාවක් ලෙස ද කොකෝවා වගා කළ හැකිය. කොකෝ වගාව සඳහා මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, බදුල්ල, මොණරාගල හා කළුතර යන දිස්ත්‍රික්ක දායක වේ. මෙම කර්මාන්තයෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට නම් යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

බෝගයේ මූලික ලක්ෂණ

සදාහරිත බහු වාර්ෂික ශාකයකි. සිරස් කඳක් හා කුඩ හැඩැති වියනක් සහිතයි. පත්‍ර සරලය විශාල පත්‍ර තලයක් හා මාංසල පත්‍ර නටුවක් දරයි. සිරිස් අතු - පත්‍ර සර්පිලාකාරව පිහිටයි. හරස් අතු - පත්‍ර ලීකාන්තරව පිහිටයි.

කොකෝවා වර්ග

බීජයේ පතුවල වර්ණය අනුව ප්‍රධාන කොකෝවා වර්ග 03කි. එනම් ක්‍රියෙලෝ (ක්‍රීම් වර්ණ), ෆොරැස්ටරෝ (තද දම්), ට්‍රිනිටාරියෝ (ක්‍රීම්/සුදු සිට දම් පැහැ දක්වා වර්ණ පරාසය)

කොකෝවා ප්‍රභේද

1)SCA6 x ICS6, 2) Na32 x ICS1, 3) W-6/457, 4) Millawana, 5)W-5/5

වගාවට අවශ්‍ය පරිසර සාධක හා දේශගුණය

වර්ෂාපතනය	- මිලී. 1650 - 2750
උෂ්ණත්වය	- සෙ. ග්‍රේඩ්. 24 - 27
ආලෝක තත්වය	- 60% - 65%
සුළඟ	- දැඩි සුළං නුසුදුසුය.
පස	- ජලය හොඳින් බැස යන (පී.එච් අගය 6- 6.5) ලෝම පස / රතු කහ පොඩ්සොලික් පස
උච්චත්වය	- මැදරට සහ පහතරට

තවාන් පාලනය

බීජ මඟින්, අතු කැබලි මඟින් හා බද්ධ පැළ මඟින් පැළ ලබාගනු ලැබේ.

බීජ මඟින් පැළ ලබා ගැනීම

- ඉදුණ ගෙඩි නෙලා ඇට ඉවත් කර ගන්න. වැලි හෝ කොහුබත් සමඟ තද්දින් මිශ්‍ර කරමින් සෙවලමය කොටස් ඉවත් කරන්න. බීජාවරණය ඉවත් කර පොලිතීන් බඳුන් තුළ සිටුවන්න.
- අතු කැබලි මඟින් පැළ ලබා ගැනීම.
  අඩක් මේරූ ගැට දෙකක් හා එක් පත්‍රයක් සහිත අතු කැබලි ලබා ගන්න. දළු කැබලි වැලි සහ කොහුබත් සම සමව ගෙන සකසාගත් මිශ්‍රණයක් සහිත 8 x 5 cm පොලිතීන් මළුවල සිටුවා අවශ්‍ය පමණ ජලය, දිලීර නාශක යොදා ආර්ද්‍රතා කුටිය තුළ තබන්න.

පැළ දැඩි කිරීම

තවානේ පැළ ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීමට පෙර ඒ සඳහා ක්‍රමිකව හුරු කළ යුතු වේ. සාමාන්‍යයෙන් තවානේ දී අඩු සූර්යාලෝකයත් අඩු උෂ්ණත්වයත්, වැඩි ආර්ද්‍රතාවයත්, අඩු සුළං තත්වයකුත් පවතින අතර ක්ෂේත්‍රයේ දී ඊට ඉඳුරාම වෙනස් තත්ව පවතී.

සහතික කළ පැළයක ලක්ෂණ

උසස් වර්ගයක වැඩි අස්වනු සහිත මවු ශාකවලින් ලබාගත් සෞඛ්‍ය සම්පන්න නිරෝගී පැළයක්වීම, පත්‍ර 8 - 10 ක් සහිතවීම, මනාව දැඩි වූ දිරිමත් එකක් වීම.

සෙවණ සහ වසුන් යෙදීම

සෙවන සැපයීම	- වැඩි සූර්යාලෝකයෙන්, උෂ්ණත්වයෙන් හා අඩු ආර්ද්‍රතාවයෙන් පැළ ආරක්ෂා කිරීම.
වසුන් යෙදීම	- පසේ තෙතමනය සුරැකීම හා පාංශු පෝෂක තත්ව වැඩි දියුණු කිරීම

- තනි වගාවක - ඉඩම පිරිසිදු කිරීම හා පැළ සිටුවීමට මාස 06කට පෙර සෙවන ශාක ලෙස අඩි (10' x 10') පරතරයට ග්ලිරිසීඩියා හෝ චිරබදු සිටුවන්න.
- පැළ අතර පරතරය අඩි (10' x 10'). වලක ප්‍රමාණය අඩි (1.5' x1.5'x1.5').
- එම වලවල් පිරවීම සඳහා මතුපිට පස් හා ගොම පොහොර යොදා ගන්න. වල් මර්දනය කරන්න. අක්කරයකට පැළ 440කි.
- යල හෝ මහ කන්න ආරම්භයේ දී පැළ සිටුවා වසුන් යොදන්න. අවශ්‍ය නම් ජල සම්පාදනය කරන්න.

අතුරු බෝග වගාව

- රබර් වගාව (අඩි 27' x 8') අතර කොකෝවා තනි පේළියක් ලෙස අඩි 10 පරතරයට සිටුවන්න.
- වයස අවුරුදු 12 - 40 අතර පොල් වගාව (අඩි 26' x 26') සමඟ අතුරු ඉඩකඩේ අඩි 10' පරතරයෙන් තනි පේළියක් හෝ අඩි 8' පරතරයට පේළි දෙකක් සිටුවිය හැකිය.

කොකෝවා කප්පාදුව හා නඩත්තුව

ස්ථාපන ප්‍රතිශතය වැඩි කර ගැනීම හා සෞඛ්‍ය සම්පන්න වගාවක් පවත්වා ගැනීම සඳහා පාළු සිටුවීම, සෙවන හා වල් පැළෑටි පාලනය, කොකෝවා කප්පාදුව, පොහොර යෙදීම ආදිය නිසි ලෙස කළ යුතුය.

කප්පාදු කරන අවස්ථා

සම්බර හා අවශ්‍ය උසක වියනක් පවත්වා ගැනීම, රෝග පළිබෝධ හානි වූ අතු ඉවත් කිරීම හා පැරණි වගා පුනරුත්ථාපනය සඳහා.

රසායනික පොහොර යෙදීම

යූරියා, රොක් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ් හා කීසරයිට් 4 : 5 : 3.5 : 1 මිශ්‍රණයෙන් පහත වගුවේ ලෙස එක් පැළයකට යොදන්න. ගසේ මුල සිට අඩි 1/2ක් දුරින් හා අතු විහිදී ඇති පරාසය තුළ යොදන්න.

වසර	යල (ග්‍රෑම්)	මහ (ග්‍රෑම්)
මාස 06 පසු	125	125
02 වන වසර	250	250
03 වන වසර සහ පසු (අවමය)	375	375

රෝග හා පළිබෝධ

ගෙඩි කුණුවීමේ රෝගය	- ගෙඩි මත තෙත දුඹුරු පැල්ලම් ඇතිවේ.
මර්දනය	- අසාදනය වූ සියළු ගෙඩි විනාශ කරන්න, අනවශ්‍ය සෙවන කප්පාදු කරන්න, බෝඩෝ මිශ්‍රණය හෝ සුදුසු දිලීර නාශකයක් යොදන්න.
කඳ පිළිකාව	- අසාදිත ස්ථානයේ පොත්ත අඳුරුපැහැ වේ. පසුව පොත්ත පිපිරී රතු පැහැ ද්‍රව්‍යක් ගලයි. අතු මැරී යයි.
මර්දනය	- අසාදිත ගෙඩි ඉවත් කරන්න. 1% බෝඩෝ මිශ්‍රණය ආසාදිත තැන පාප්පයක් ලෙස යොදන්න.
කොකෝවා ඩයිබැක්	- පත්‍ර කහපාට වී අතු මැරී යයි
මර්දනය	- ආසාදිත ශාක කොටස් ඉවත් කරන්න.

පළිබෝධ

කොකෝවා කැප්සිඩ් මකුණා	- ගෙඩි වල යුෂ උරාබොයි. කුඩා ගෙඩි වියළී යයි. සූර්යාලෝකය වැඩි විට මෙම පළිබෝධකයා වර්ධනය වේ.
මර්දනය	- සෙවන පාලනයෙන් මර්දනය කළ හැකිය.

අස්වනු නෙලීම හා සැකසීම

පැළ සිටුවා වසර 03කින් අස්වනු ලැබේ. මල් හටගෙන මාස 05කින් අස්වනු නෙලිය හැකිය. නෙලීමට තියුණු පිහියක් යොදාගන්න, නෙලූ ඵල වහාම ලී උපකරණයකින් පලා පල්පය සහිත බීජ ගෝනිවලට හෝ වේවැල් කූඩවලට පමණක් එකතු කරන්න. පැසවීම තුළින් කොකෝ බීජ පදම් කරනු ලැබේ. බීජයේ කලලය මැරුණ විට පමණක් කොකෝවා වල රස හා සුවඳ නිපදවීම මීට හේතුවයි. ලී පෙට්ටි මේ සඳහා යොදා ගනී. දින දෙක තුනක් හොඳින් පැසවන ලද බීජ සෝදා පැදුරු මත හෝ සිමෙන්ති පොළවෙහි දින 07ක් වියළිය යුතුය. නැතහොත් කෘත්‍රිම වියළනයකින් වියළා ගන්න.

අක්කරයක සාර්ථකව නඩත්තු කරන කොකෝවා වගාවකින් කි.ග්‍රෑම් 1,000ක පමණ අස්වැන්නක් ලබා ගත හැකිය.

කොකෝවා වල ප්‍රයෝජන - අතිශය ප්‍රණීත රසකින් හා සුවඳකින් යුතු කොකොවා චොකලට් කර්මාන්තය, ආහාර රසකාරක හා බීමක් ලෙස සුලභව යොදා ගනී.

Written By : Ruwan Basnayake
Designed By : Prasanna Thilakarathne | Asha Lakmali